විභාග අංකය - .....

සියලුම හිමිකම් ඇවිරිණි. All Rights Reserved]

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත Provincial Department of Education, Eastern Province Provincial Department of Educationපළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත Provincial Department of Education, Eastern Province Provincial Department of Education, Eastern Province

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත

Provincial Department of Education, Eastern Province

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පෙරහුරු ඇගයීම - 2025

General Certificate of Education (Adv. Level) Practice Assessment - 2025

දේශපාලන විද්‍යාව - I
Political Science - I

23 S I

ශ්‍රේණිය 13
Grade 13

පැය දෙකයි
Two hours

උපදෙස්

- මෙම ප්‍රශ්න පත්‍රය A සහ B යනුවෙන් කොටස් දෙකකින් සමන්විතය.
- A කොටස බහුවරණ ප්‍රශ්න 30 කින් සහ B කොටස කෙටි ප්‍රශ්න 20 කින් යුක්ත වේ.
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු මෙම පත්‍රයේම සැපයිය යුතුය.
- එක් පිළිතුරකට ලකුණු දෙක බැගින් ලකුණු 100 කි.

A කොටස

- **අංක 01 සිට 20 තෙක් ඇති ප්‍රශ්න වලට නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

1. දේශපාලන විද්‍යාව

   1. බල අරගලය සමග සමපාත වේ.
   2. ස්ථිතික විෂයක් සේ සැලකේ.
   3. දේශපාලනය ශාස්ත්‍රීයව අධ්‍යයනය කරයි.
   4. ආණ්ඩුකරණ ක්‍රියාවලිය අධ්‍යයනය කිරීමට සීමා වේ.
   5. ස්වභාවික විද්‍යා ක්ෂේත්‍රයෙහි ශාඛාවකි. (.....)

2. දේශපාලනය

   1. දේශපාලන ප්‍රභූන්ට සීමා වූ ක්‍රීඩාවකි.
   2. පක්ෂ වලින් කරනු ලබන ක්‍රීඩාවකි.
   3. සෑමවිටම න්‍යායාත්මක කරුණු මත රදා පවතී.
   4. විශ්වීය වශයෙන් පොදු සංකල්පයකි.
   5. රාජ්‍ය පරිපාලනය හා සමාජ භාවිතයක්ද වේ. (.....)

3. බලතල බෙදීමේ සංකල්පය

   1. මධ්‍යම හා ප්‍රාන්ත අතර බලය බෙදීම අදහස් වන සංකල්පයකි.
   2. අත්තනෝමතික පාලන ක්‍රමය වළකයි.
   3. නිර් ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පයකි.
   4. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක මූලික මූලධර්මයකි.
   5. බලතල බෙදා වෙන් කිරීමේදී විධායකයට ප්‍රමුඛත්වය දීම අරමුණු කරයි. (.....)

4. රාජ්‍යය

    1. අනෙකුත් සමාජ සංවිධාන අතර සමානත්වයක් ගනී.
    2. සමාජවාදීන් විසින් පොදු සමාජ සංවිධානයක් ලෙස හඳුන්වයි.
    3. අනෙකුත් සංවිධාන අතර උත්තරීතරම සංවිධානය වේ.
    4. ආණ්ඩුවේ හස්තය ලෙස ක්‍රියා කරයි.
    5. අස්ථාවර දේශපාලන සංවිධානයකි. (.....)

5. ඒකීය ආණ්ඩුක්‍රමයට අදාළ නොවන්නේ,

    1. පහළ මට්ටමේ ආයතන අහෝසි කිරීමට මධ්‍යම ආණ්ඩුවට හැකි වේ.
    2. සාපේක්ෂ වශයෙන් සංකීර්ණත්වයකින් යුක්ත වූවකි.
    3. තනි ජාතික ආණ්ඩුව වටා ස්වාධිපති බලය සංකේන්ද්‍රනය වේ.
    4. ද්විත්ව පුරවැසිභාවයක් දක්නට නොමැත.
    5. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ලිඛිත හෝ අලිඛිත විය හැකිය. (.....)

6. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයේ ලක්ෂණයක් වන්නේ,

    1. කැබිනට් මණ්ඩලය ව්‍යවස්ථාදායකයට පරිබාහිරව පත් වේ.
    2. විධායක හා ව්‍යවස්ථාදායක අංශ අතර විධිමත් බෙදීමක් පවතී.
    3. ආණ්ඩුවේ රදා පැවැත්ම පාර්ලිමේන්තු සහාය මත රදා පවතී.
    4. සාපේක්ෂ වශයෙන් වඩාත් ස්ථාවර ආණ්ඩු ක්‍රමයයි.
    5. ජනාධිපතිගේ නායකත්වයෙන් කැබිනට් මණ්ඩලය රැස් වේ. (.....)

7. ධනවාදී පාලන ක්‍රමයක මූලික ලක්ෂණයක් නොවන්නේ,

    1. නිදහස් ව්‍යවසායකත්වයක් නොමැති වීම.
    2. පෞද්ගලික ව්‍යවසාය හා පෞද්ගලික දේපළ හිමිකම.
    3. ආර්ථිකය පාලනය කිරීමට රාජ්‍යයයේ අවම මැදිහත් වීම.
    4. ඉල්ලුම් සැපයුම් න්‍යාය ප්‍රයෝගික වීම.
    5. විවෘත වෙළඳපොළ ක්‍රමය. (.....)

8. සමාජවාදී රාජ්‍ය මාදිලියේ ලක්ෂණයක් නොවන්නේ,

    1. මධ්‍යගත සැළසුම් ක්‍රමය දක්නට ලැබීම.
    2. පොදු දේපළ සංකල්පය.
    3. රාජ්‍යය ව්‍යවසාය ක්‍රමය.
    4. තරගකාරී දේශපාලන පක්ෂ ක්‍රමය.
    5. නිර්ධන පන්තියේ ආඥා දායකත්වය. (.....)

9. නව ලිබරල්වාදී රාජ්‍යයට අදාළ නොවන්නේ,

    1. ලිබරල් රාජ්‍යය ආණ්ඩුපාලනයට පමණක් සීමා වේ.
    2. ජාතික ආර්ථිකයක් විවෘත කිරීමට රාජ්‍යය පියවර ගනී.
    3. ධනවාදී ආර්ථික හා දේශපාලන බලවේගයන් ලොව පුරා තහවුරු වීමේ පසුබිමෙහි බිහි විය.
    4. රාජ්‍ය කළමනාකරුවෙකු බවට පත් වේ.
    5. ජගත් ආර්ථිකය හැසිරවීම නව ලිබරල් රාජ්‍යයේ ප්‍රමුඛ කාර්යයකි. (.....)

10. රාජ්‍යය පිළිබඳ සමාජ සම්මුතිවාදී න්‍යාය,

1. රාජ්‍යය ක්‍රමික සමාජ විකාශනයක ප්‍රතිඵලයක් බව දක්වයි.
2. රාජ්‍යයට සමාජමය උපතක් පවතින බව අවධාරණය කරයි.
3. රාජ්‍යය මනුෂ්‍යන්ගේ ජීවිතයේ සෑම අවධියකම පැවැතුණ බව පිළිගනී.
4. තෝමස් හොබ්ස්ට අවශ්‍ය වූයේ ජනතාවට වග කියන පාලකයෙක් බිහි කිරීමටයි.
5. දේවවරම්වාදී අදහස් වල පිබිදීමක් සමග මතු වූ න්‍යායකි. (.....)

11. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයට අදාළ වන්නේ,

1. දිගු ඉතිහාසයකට හිමිකම් කියයි.
2. සීමිත ජන්ද බලය හදුන්වා දීමෙන් පසු අනුප්‍රාණය ලැබුණි.
3. දක්ෂිණාංශික පක්ෂ පමණක් ආධිපත්‍ය දරයි.
4. අධිපති ද්වි පක්ෂ ක්‍රමය ක්‍රමයෙන් වියැකී යමින් පවතී.
5. වාර්ගික පක්ෂ ක්‍රමයක් දක්නට නොවේ. (.....)

12. ජාත්‍යන්තර දේශපාලනයට අදාළ නොවන්නේ,

1. ජාත්‍යන්තර ආර්ථික සබඳතා ජාත්‍යන්තර දේශපාලනයේ හැඩ ගැස්ම තීරණය කරයි.
2. රාජ්‍ය ක්‍රියාධරයන්ට පමණක් අනන්‍ය ක්‍රියාවලියකි.
3. ජාතීන් අතර සිදුවන බාහිර සබඳතා ජාලයයි.
4. අරාජික හා අනාරක්ෂිත ස්වභාවයකින් ද යුක්තය.
5. කීර්තිමත් පුද්ගලයන්ට එහි හැඩය වෙනස් කළ හැකිය. (.....)

13. රාජ්‍ය ප්‍රතිපත්ති,

1. ශාස්ත්‍රීයව හැදෑරීම ග්‍රීක යුගයේ දී ඇරඹුණි.
2. ක්‍රියාවට නංවනු ලබන්නේ ව්‍යවස්ථාදායකයයි.
3. රාජ්‍ය ප්‍රතිපත්ති හා සම්බන්ධව දේශපාලන පක්ෂ යනු වැදගත් දේශපාලන ආයතනයක් නොවේ.
4. ක්‍රියාවට නංවන නිසි බලධාරී ආයතනය දේශපාලන විධායකයයි.
5. නෛතික ගැටලු නිරාකරණයට අධිකරණය මැදිහත් නොවේ. (.....)

14. සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1. නිරාගමිකවාදය ආගමික රාජ්‍යයන්ට මග පාදයි.
2. ස්ත්‍රීවාදය ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව අගයයි.
3. ලිබරල්වාදය නීර් ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහි වේ.
4. සමාජවාදය ආර්ථික තරගයට එරෙහි වේ.
5. ෆැසිස්ට්වාදීහු රාජ්‍යයේ උත්තරීතර බව අගයයි. (.....)

15. ප්‍රංශ ආණ්ඩු ක්‍රමය

1. ජාතික මන්ත්‍රණ සභාවට කැබිනට් මණ්ඩලය විශ්වාසභංගයකින් ඉවත් කළ හැකි වේ.
2. ජනාධිපතිධූරය ව්‍යවස්ථාදායකයට පහළින් තැබීම එහි මූලික ලක්ෂණයකි.
3. ව්‍යවස්ථාදායකය ඒකමාණ්ඩලිකවාදය මත පිහිටුවා ඇත.
4. නූතන ලෝකයේ බිහි වූ ප්‍රථම ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවයි.
5. දේශපාලන බලය විමධ්‍යගත කිරීමක් දක්නට ලැබේ. (.....)

16. ස්විට්සර්ලන්ත ආණ්ඩු ක්‍රමය,

1. සම්භාව්‍ය සහසංධීය ක්‍රමය නිරූපනය කරයි.
2. ජාතික මණ්ඩලය කැන්ටන් නියෝජනය කරයි.
3. ප්‍රංශ ආක්‍රමණ හේතුවෙන් සහසංධීය ක්‍රමය සංධීය ක්‍රමයක් බවට පත්ව ඇත.
4. සෘජු ප්‍රජාතන්ත්‍රවාදී භාවිතාවන් අවප්‍රමාණය වේ.
5. අගමැතිවරයෙකුගේ නායකත්වයෙන් ක්‍රියාත්මක වේ. (.....)

17. 1833 ට පෙර පැවති රාජකාරි ක්‍රමයට අදාළ නොවන්නේ,

1. ශ්‍රමය සංචලනය නොවීය.
2. මිනිස් ශ්‍රමය ඉඩමට බැඳ තබා තිබුණි.
3. කුල ක්‍රමය ශක්තිමත් විය.
4. නව ධනේෂ්වර ආර්ථිකයකට බාධාකාරී විය.
5. දේශීය කෘෂිකර්මාන්තය අඩාල විය. (.....)

18. 1910 ප්‍රතිසංස්කරණයට අදාළ නොවන්නේ,

1. ව්‍යවස්ථාදායකයේ සභිකයින් ප්‍රසාරණය කළේය.
2. වාර්ගික නියෝජන ක්‍රමය පවත්වාගෙන යන ලදි.
3. ව්‍යවස්ථාදායක සභාවේ මූලිකත්වයෙන් ආණ්ඩුකරු ඉවත් කරන ලදි.
4. සීමිත ඡන්ද බලය හදුන්වාදෙන ලදි.
5. මුදල් කාරක සභාවක් පිහිටුවනු ලැබීය. (.....)

19. 1931 ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය,

1. සභිකයන් හත් දෙනෙකුගෙන් යුත් අමාත්‍ය මණ්ඩලය.
2. ආණ්ඩුකරු සාමාජිකත්වය නොදැරූ ව්‍යවස්ථාදායකය.
3. කිරීටයට වගකීමට යටත් නොවූ ආණ්ඩුක්‍රමය.
4. නිර්බාධවාදී ප්‍රතිපත්තිය ආරෝපණය කළ ආණ්ඩුක්‍රමය.
5. වාර්ගික නියෝජනය පවත්වාගෙන ගිය ආණ්ඩුක්‍රමය. (.....)

20. 1972 ජනරජ ව්‍යවස්ථාව සම්බන්ධ නිවැරදි වන්නේ,

1. බලය කේන්ද්‍රගත වූ ජනාධිපතිධූරයක් හදුන්වා දුනි.
2. අධිකරණයට විෂය වූ ප්‍රතිපත්ති ප්‍රකාශයක් හදුන්වා දුනි.
3. මූලික අයිතිවාසිකම් විමර්ශනයට ඔම්බුඩ්ස්මන් ධූරය හදුන්වා දුනි
4. අමාත්‍ය මණ්ඩලයට යටත් වූ රාජ්‍ය සේවයක් හදුන්වා දුනි.
5. බලතල බෙදීමේ න්‍යාය මත ආණ්ඩු ක්‍රමය ගොඩ නගන ලදි. (.....)

- **අංක 21 සිට 25 තෙක් ප්‍රශ්න වලට දී ඇති ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශ කාණ්ඩය ඇතුළත් වරණය තෝරන්න.**

21. 1947 සෝල්බරී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව,

A. වෙස්මිනිස්ටර් ආණ්ඩුක්‍රමය පදනම් කරගත්තේය.
B. ව්‍යවස්ථාදායකය ද්විමාණ්ඩලිකවාදය මත පදනම් විය.
C. කැබිනට් මණ්ඩලය මහජන මන්ත්‍රී මණ්ඩලයෙන් පමණක් සමන්විත විය.
D. අග්‍රාණ්ඩුකරුගේ රාජ්‍ය නායකත්වයෙන් ක්‍රියාත්මක විය.
E. ස්වාධීන රාජ්‍ය සේවයක් ක්‍රියාත්මක විය.

1. ABCD 2. ABCE 3. ABDE 4. ACDE 5. BCDE

(.....)

22. සමාජ ගැටුම්,

A. එකිනෙකට නොගැළපෙන හා අසංගත අරමුණු නිසා හට ගනී.
B. කැරලිකාර පාර්ශව දේශපාලන ප්‍රවාහයෙන් බැහැර කිරීම සාම ගිවිසුමේ ලක්ෂණයකි.
C. නිෂේධනීය මෙන්ම සාධනීය විය හැකිය.
D. රාජ්‍ය අභ්‍යන්තර ගැටුම් වලට බොහෝ විට නිමිත්ත වන්නේ දේශපාලන බලයයි.
E. සහමන්ත්‍රණය ගැටුම් විසඳීමට යොදා ගත හැකි සාධනීය මාධ්‍යයකි.

1. ABCD 2. ABCE 3. ABDE 4. ACDE 5. BCDE

(.....)

23. සමූහාණ්ඩුවාදී මතවාදය,

A. දිගු ඉතිහාසයකින් යුක්ත මතවාදයකි.
B. සමූහාණ්ඩුවාදී අදහස් අවධි හතරකින් වර්ධනය වී ඇත.
C. පුරවැසියා දේශපාලනික වශයෙන් සක්‍රීය විය යුතු බව අවධාරණය කරයි.
D. නිදහස රැක ගැනීමට පුරවැසි ක්‍රියාකාරීත්වය අත්‍යවශ්‍ය බව පිළිගනී.
E. පරමාධිපතිබලයේ හිමිකරුවා පාලකයා බව අවධාරණය කරයි.

1. ABCD 2. ABCE 3. ABDE 4. ACDE 5. BCDE

(.....)

24. ශ්‍රී ලංකාවේ මෑත කාලීන විදේශ ප්‍රතිපත්තිය,

A. පවත්නා ගෝලීය ලෝක ක්‍රමය තුළ අනිසි මැදිහත්වීම් වලට ලක් නොවීමේ අභියෝගය පවතී.
B. සාගරික දේශපාලන හා ආර්ථික සබඳතා වල අනිවාර්ය නොවූ සාමාජිකයෙක් ලෙස සැලකේ.
C. ආර්ථික රාජ්‍ය උපාය මාර්ග වලට මුල් තැනක් ලබා දේ.
D. ඉන්දියාව සමඟ සමීපව ක්‍රියාත්මක වේ.
E. පාලන තන්ත්‍රයේ අභිලාෂයන්ද එමගින් නිරූපණය වේ.

1. ABCD 2. ABCE 3. ABDE 4. ACDE 5. BCDE

(.....)

25. යටත්විජිත යුගයේ ලංකාව,

A. අධිරාජ්‍යවාදී අවශ්‍යතාවන්ට අනුව පාලනය විය.
B. ලාංකික නායකයන්ට පාලනයට සම්බන්ධ වීමේ ඉඩකඩ ක්‍රමයෙන් සීමා විය.
C. දේශපාලන පක්ෂ බිහි වීමට පසුබිම සැකසුනි.
D. වර්ගවාදී දේශපාලනය ක්‍රමයෙන් අඩපණ විය.
E. නියෝජන ආණ්ඩුක්‍රමය පුළුල් විය.

1. ABCD 2. ABCE 3. ABDE 4. ACDA 5. BCDE

(.....)

- **අංක 26 සිට 30 තෙක් ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙක බැගින් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධ දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැළපෙන්නේ පහත වගුවේ දැක්වෙන 1,2,3,4, සහ 5 යන වර්ණ වලින් කවර වරණය දැයි තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.**

අංකය	පළමු ප්‍රකාශය	දෙවැනි ප්‍රකාශය
1.	සත්‍ය	සත්‍ය
2.	සත්‍ය	අසත්‍ය
3.	අසත්‍ය	සත්‍ය
4.	අසත්‍ය	අසත්‍ය
5.	සත්‍ය	සත්‍ය වන අතර පළමු ප්‍රකාශය නිවැරදිව විස්තර කරයි

	පළමුවැනි ප්‍රකාශය	දෙවැනි ප්‍රකාශය	
26.	නව ව්‍යවස්ථාවක් පැනවීමකින් තොරව පවතින ව්‍යවස්ථාව අහෝසි කිරීමේ බලය 1978 ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුව සතු වේ.	1978 ආණ්ඩුක්‍රමය තුළ පාර්ලිමේන්තු මැතිවරණ පෙත්සම් විභාග කිරීමේ බලය අභියාචනාධිකරණය සතු වේ.	(.....)
27.	1978 ව්‍යවස්ථාවේ 18 හා 19 වන සංශෝධන එකිනෙකට පරස්පර මූලික අරමුණු දෙකක් සාක්ෂාත් කර ගැනීම සඳහා ඉදිරිපත් විය.	19 සංශෝධනය මඟින් සංවරණ හා තුලන ක්‍රමයක් ස්ථාපිත කිරීම අරමුණ වූ අතර 18 වන සංශෝධනය මඟින් ශක්තිමත් විධායක ජනාධිපතිවරයෙක් බිහි කිරීම අරමුණු විය.	(.....)
28.	1978 ව්‍යවස්ථාවේ 20 වන සංශෝධනයට අනුව ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව රැස් වී වසර 2 1/2 ඉක්ම යාමට පෙර එය විසුරුවා හැරිය නොහැක.	පාර්ලිමේන්තුවේ බහුතරයක් විසින් කරන ඉල්ලීමකට අනුව වසර 2 1/2 පෙර වුවද පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ජනාධිපතිට බලය හිමි වේ.	(.....)
29.	1978 ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයට නොරතුරු දැන ගැනීමේ අයිතිය ප්‍රථම වරට ඇතුළත් කළේ 2010 දී සිදු කරන ලද 18 වන සංශෝධනය මගිනි.	1978 ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් පවතින ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස මානව හිමිකම් කොමිෂන් සභාව හඳුන්වා දිය හැකිය.	(.....)
30.	1978 ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය මගින් හඳුන්වාදුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සාමාජිකයන් 7 දෙනෙකුගෙන් සමන්විතය.	19 වන සංශෝධනයෙන් පිහිට වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව තුළ ජන වර්ග තුනෙන් පත්වන සිවිල් පුද්ගලයන් තුන්දෙනෙක්ද ඇතුළත් විය.	(.....)

B කොටස

- **ප්‍රශ්න අංක 31 සිට 50 දක්වා ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.**

31. 'සිවිල් සමාජය වනාහි ධනවාදී වෙළඳපොළ පිළිබඳ අවකාශයයි.'
ඉහත ප්‍රකාශය ඉදිරිපත් කල ජර්මන් දාර්ශනිකයින් දෙදෙනා නම් කරන්න.
I. .....
II. .....

32. විද්‍යාත්මක අධ්‍යයන ප්‍රවේශයට අදාළ එය සතු ප්‍රධාන ලක්ෂණ දෙක මොනවාද?
I. .....
II. .....

33. දේශපාලන විද්‍යාවේ විෂය ස්වභාවය හදුනා ගැනීමේදී නිරාවරණය වන මූලික ලක්ෂණ තුනකි. ඉන් දෙකක් නම් කරන්න.
I. .....
II. .....

34. පහත ලක්ෂණ සහිත රාජ්‍ය මාදිලි දෙක නම් කරන්න.
I. 'ජ්‍යෙෂ්ඨත්වය මත පත්වන පාලකයාට ඇත්තේ සීමිත බල අධිකාරයක් පමණි.'
.....
II. 'පාරම්පරිකව පත්වන පාලකයාට ඇත්තේ අසීමිත බල අධිකාරයකි.'
.....

35. පීන් බොඩෑන්ට අනුව ස්වාධිපත්‍ය තුළ හදුනාගත හැකි මූලික ලක්ෂණ තුනකි. ඉන් දෙකක් නම් කරන්න.
I. .....
II. .....

36. වර්තමානයේදී රාජ්‍ය හා පුරවැසියා අතර සම්බන්ධතාවේ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් තිබේ. ඒ මොනවාද?
I. .....
II. .....

37. පහත සඳහන් කෘතීන් රචනා කරන ලද දේශපාලන දාර්ශනිකයන් නම් කරන්න.
I. ජාතික රාජ්‍යයේ අවසානය .....
II. සමාජ ගිවිසුම .....

38. පහත සඳහන් දේශපාලන සංකල්ප ඉදිරිපත් කරන ලද්දේ කවුරුන්ද?
I. 'සුපිරි මිනිසා' .....
II. 'සමාජ පුරවැසිභාවය' .....

39. සංධීය ආණ්ඩුක්‍රමයේ අවාසි දෙකක් සඳහන් කරන්න.
I. .....
II. .....

40. රාජ්‍ය පිළිබඳ ඉදිරිපත් වූ මාක්ස්වාදී න්‍යායට අනුව රාජ්‍යය ප්‍රභවය වන යුගය සහ රාජ්‍යය වියැකී යන යුගය පිළිවෙලින් නම් කරන්න.
I. .....
II. .....

41. රාජ්‍ය ප්‍රතිපත්ති හැදෑරීම දෙආකාර ස්වභාවයක් ගනී. ඒවා නම් කරන්න.

I. .....

II. .....

42. 1947 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව පිහිටුවීමෙන් අපේක්ෂිත මූලික අරමුණු දෙක මොනවාද?

I. .....

II. .....

43. වෙස්ට්මෝලියානු සාම සම්මුතිය මගින් නූතන රාජ්‍ය පිළිබඳ ප්‍රධාන අදහස් දෙකක් බිහි විය. ඒවා නම් කරන්න.

I. .....

II. .....

44. 1972 පළමු ජනරජ ව්‍යවස්ථාවෙන් ස්ථාපිත කළ ව්‍යවස්ථාදායකයේ නිල නාමය හා නාමික විධායකයේ නිල නාමය පිළිවෙලින් ලියන්න.

I. .....

II. .....

45. ගැටුම් වල සාධනීය පැතිකඩ පවතින බව ඉදිරිපත් කල සමාජ විද්‍යාඥයින් දෙදෙනා නම් කරන්න.

I. .....

II. .....

46. 1978 ව්‍යවස්ථාවේ පාර්ලිමේන්තුවේ නිල කාලය වසරකින් අඩු කළ සහ ජනාධිපති මාස තුනකට වරක් පාර්ලිමේන්තුවට පැමිණිය යුතුය. යන සංශෝධනය සිදු කළ ව්‍යවස්ථා සංශෝධන දෙක පිළිවෙලින් ලියන්න.

I. .....

II. .....

47. ජාත්‍යන්තර දේශපාලනයේ රාජ්‍ය නොවන ක්‍රියාධරයින් දෙදෙනෙක් නම් කරන්න.

I. .....

II. .....

48. ගැටුම් පරිවර්තනය ආකාර කිහිපයකින් සිදු වේ. ඉන් දෙකක් ලියන්න.

I. .....

II. .....

49. රාජ්‍ය පිළිබඳ ෆැසිස්ට්වාදී නිර්වචන අතරින් කැපී පෙනෙන නිර්වචන දෙකක් පවතී. ඒවා නම් කරන්න.

I. .....

II. .....

50. ශ්‍රී ලංකාවේ යටත් විජිත පාලන සමය තුළ පූර්ව පක්ෂ දේශපාලන සංවිධාන දෙකක් ප්‍රධාන ලෙස ගොඩනැගී තිබුනි. ඒවා නම් කරන්න.

I. .....


II. .....

LOL
Book Store

වාරෙටම ඕන කරන පොත් එකපාර
ඕඩර් කරලා දැන් ගෙදරටම ගෙන්වා ගන්න

25% OFF
ALL BOOKS

**Including Exercise Books,
CR Books, and B5 Books**



ඕනෙම අභ්‍යාස පොතකට 25%ක විශේෂ වට්ටමක්

ORDER BOOKS FROM LOL BOOKS STORE

0372060110 **WWW.LOL.LK**

071 777 4440 (WhatsApp)

Cash On Delivery Available

ORDER GCE A/L SHORT NOTES, MODEL, REVISION BOOKS & PAST PAPERS IN SINHALA, ENGLISH & TAMIL MEDIUM





LOL BOOK STORE

CASH ON DELIVERY AND KOKO PAYMENT AVAILABLE

WHATSAPP - 0717774440

WEBSITE: WWW.LOL.LK

GET READY FOR YOUR A/Ls WITH LOL BOOK STORE!